රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 42/94

මගේ අංකය :- IV/2/3/9(එච්)පොදු/74,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි
කර්මාන්ත හා පාර්ලිමේන්තු කටයුතු
අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1994.12.29 වෙනි දින.

සියළුම ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

විශ්‍රාම වැටුප් සහිත සේවාවල වසර 10 කට අඩු සේවා කාලයක්
ඇති එහෙත් අනියම් හා තාවකාලික සේවා කාලයක්ද සමග වසර
<u>10 කට වැඩි සේවයක් ඇති කම්කරුවනට විශ්‍රාම වැටුප් ලබා ගැනීම.</u>

1994.05.11 දින රැස්වූ අමාත්‍ය මණ්ඩලය පහත සඳහන් තීරණයට එළඹ ඇත.

> "1980.01.01 දින සිට දෙපාර්තමේන්තු වසා දැමීම හේතුවෙන් විශ්‍රාම වැටුප් නොමැතිව විශ්‍රාම ගන්වන ලද කම්කරුවන් සම්බන්ධයෙන් ඔවුන් විශ්‍රාම ගන්වනු ලැබූ අවස්ථාව වන විට අවම වශයෙන් පස් වසරක ස්ථිර සේවා කාලයක් තිබුනේ නම්, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 20 'අ' (1) වගන්තියට අනුව කවර හෝ අනියම් හෝ තාවකාලික සේවා කාලයක් වී නම් එයද එකතු කර විශ්‍රාම ගැන්විය යුතුය"

02. ඉහත අමාත්‍ය මණ්ඩල තීරණයේ දක්වා ඇති කරුණු අනුව කටයුතු කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

අ.කලේ/(ආර්.එස්.ජයරත්න)
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
වැවිලි කර්මාන්ත හා පාර්ලිමේන්තු
කටයුතු අමාත්‍යාංශය.